# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,115 - 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 676 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 693 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


675 - B 81505— 5,403 (2019/03)

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

### පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති වැඩ/ක්ෂේත්‍ර කම්කරු III වන ශ්‍රේණියට බඳවා ගැනීම

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 ජනවාරි 25 වන දින නිකුත් කරන ලද *ගැසට්* අංක 2108 හා නිවේදන අංක 01-644 හි ඇති 6 වැනි ඡේදය මෙයින් සංශෝධනය කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්ත භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2019.03.20 වන දින හෝ ඊට පෙර ලේකම්, පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. තව ද කාර්යාලය වෙත භාර දිය හැකිය. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.)

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2019 පෙබරවාරි මස 13 වැනි දින,
රඹුක්පිටිය, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

03-881

---

### උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා සහ අර්ධ ශිල්පීය ගණයට අයත් තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *තනතුරු නාමය* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෘත්තීය වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික ශිල්පීය නොවන | III | 06 | රා.ප.ච. 03/2016 PL 1 - 2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | • අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| විදුලි කාර්මික | ප්‍රාථමික අර්ධ ශිල්පීය | III | 01 | රා.ප.ච. 03/2016 PL/2 - 2016 රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | • අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |

| තනතුරු නාමය | සේවක ගණය | ශ්‍රේණිය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෘත්තීය වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | • විදුලි කාර්මික ශිල්පයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br>• අදාළ ක්ෂේත්‍රයේ වසර 02ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| රියදුරු | ප්‍රාථමික ශිල්පීය | III | 02 | රා.ප.ච. 03/2016 - PL3 - 2016 රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | • අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05ක් සමත් විය යුතුය.<br>• තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. ( A පන්තියේ රියැදුරු බලපත්‍රයක්)<br>• වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.) |

03. *පොදු සුදුසුකම් හා කොන්දේසි :*

I. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

II. තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45 ත් අතර විය යුතුය. (දැනටමත් වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක ට නොඅඩු කාලයක් උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම සේවා සහතිකය ප්‍රාදේශීය ලේකම් ගේ අනු අත්සන් සහිතව ඉදිරිපත් කළ යුතුය.)

IV. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

VI. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවය කරන අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික/ගිවිසුම්ගත පදනමින් සේවය කරන සේවකයින් සඳහාද, ස්ථිර සේවයේ නියුතු අය සඳහාද, වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(ii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසි වලටද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

06. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2019.04.10 දිනට හෝ ඊට පෙර, "ලේකම්. උඩුබද්දාව ප්‍රාදේශීය සභාව, උඩුබද්දාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතුය :

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතික
03. පාසලෙන් අස්වීමේ සහතිකය
04. පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුයි.)
05. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික
06. පොලිස් සහතිකය
07. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්

කේ. කේ. යූ. ජේ. එන්. පෙරේරා,
ලේකම්,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව,
උඩුබද්දාව.

2019 මාර්තු මස 06 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ............................................................තනතුර සඳහාවූ අයදුම්පත්‍රය***

1. මුලකුරු සමග නම :——————————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.
2. පෞද්ගලික ලිපිනය:——————————————.
3. උපන් දිනය :
   වර්ෂය :—————— . මාසය :——————. දිනය :——————.
   . *(අ)* 2019.04.10 දිනට වයස :
   අවු.:——————. මාස :——————. දින :——————.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.
5. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද, ලියාපදිංචියෙන්ද, යන වග :——————————————
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
7. විවාහක/අවිවාහක බව :——————————————

8. *අධ්‍යාපන සුදුසුකම් :*

*අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (ප්‍රථම/දෙවන) :*

විභාග අංකය : ———————— වර්ෂය :———————— මාසය : ————————.

| | සමත් වූ විෂය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | ........................................ | ...................... |
| II. | ........................................ | ...................... |
| III. | ........................................ | ...................... |
| IV. | ........................................ | ...................... |
| V. | ........................................ | ...................... |
| VI. | ........................................ | ...................... |
| VII. | ........................................ | ...................... |
| VIII. | ........................................ | ...................... |
| IX. | ........................................ | ...................... |
| X. | ........................................ | ...................... |

*අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය :*

විභාග අංකය : ———————— වර්ෂය :———————— මාසය : ————————.

| | සමත් වූ විෂය | ශ්‍රේණිය |
|---|---|---|
| I. | ........................................ | ...................... |
| II. | ........................................ | ...................... |
| III. | ........................................ | ...................... |
| IV. | ........................................ | ...................... |

9. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :————————.
10. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේ ද?:————————.
11. එසේ නම් දඬුවමේ ස්වභාවය:————————.
12. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් ඉදිරිපත් කර ඇති යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මා දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................ මහතා/මහත්මිය දැනට මෙම කාර්යාලයේ .............................................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ /බලයලත් නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව .

දිනය :————————.

03-1156

## කුරුණෑගල මහා නගර සභාව

### වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය/අර්ධ ශිල්පීය/ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුරුණෑගල මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති කුරුණෑගල මහා නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2019.04.05 වන දිනට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, කුරුණෑගල යන ලිපිනයට ලැබෙන පරිදි එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස කෙළවරේ ඉහළ කොටසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

03. බඳවා ගැනීමේ පරිපාටිය අනුව දැනටමත් කුරුණෑගල මහා නගර සභාවේ සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත වූ සේවකයින්ට මෙන්ම බාහිර අයදුම්කරුවන්ට මෙම තනතුරු සඳහා අයදුම් කළ හැක.

*සුදුසුකම් :*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *සේවා බණ්ඩය හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | රියැදුරු | 02 | ප්‍රාථමික ශිල්පීය<br><br>PL - 3-2016<br>රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා:*<br>• පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>• අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති ප්‍රාථමික ශිල්පීය තනතුරුවල සේවකයින් සඳහා පමණක් එවකට බඳවා ගැනීම් පටිපාටියේ පැවති අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | • තාරබර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A) පන්තියේ රියැදුරු බලපත්‍රයක්<br><br>• *පළපුරුද්ද -*<br><br>වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *සේවා ඛණ්ඩය හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 02 | ජල පවිත්‍රාගාර කාර්මික | 02 | ප්‍රාථමික අර්ධ ශිල්පීය<br><br>PL 2 - 2016<br>රු. 25,250 -<br>10 x 270 -<br>10 x 300 - 10 x 330<br>- 12 x 350 -<br>රු. 38,450 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් සමත් වීම (වෛකල්පික විෂයන් හැර)<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>• පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br>• අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති ප්‍රාථමික ශිල්පීය තනතුරු වල සේවකයින් සඳහා පමණක් එවකට බඳවා ගැනීම් පටිපාටියේ පැවති අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | • තනතුරට අදාළ වෘත්තීය පිළිබඳව NVQ Level 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබිය යුතුයි.<br>• අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය.<br>(සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.) |
| 03 | ජල යන්ත්‍ර ක්‍රියාකරු | 01 | | | |
| 04 | පෙදරේරු | 02 | | | |
| 05 | කම්මල්කරු | 01 | | | |
| 06 | කාර්යාල කාර්ය සහායක | 03 | ප්‍රාථමික ශිල්පීය නොවන<br><br>PL 1 - 2016<br>රු. 24,250 -<br>10 x 250 - 10 x 270<br>- 10 x 300 - 12 x<br>330 - රු. 36,410 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් සමත් වීම. (වෛකල්පික විෂයන් හැර)<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>• පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br>• අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති ප්‍රාථමික ශිල්පීය තනතුරු වල සේවකයින් සඳහා පමණක් එවකට බඳවා ගැනීම් පටිපාටියේ පැවති අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | |
| 07 | පුස්තකාල උපස්ථායක | 02 | | | |
| 08 | ජල යතුරුකරු | 01 | | | |
| 09 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 10 | | | |

04. *බඳවා ගැනීමට අදාළ වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමේ සිටින සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිය තිබිය යුතුය. ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය..

(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී දඬුවම් ලැබිය යුත්තකු නොවිය යුතුය.

(vi) අයදුම්කරුවන් ඉහත අංක 03හි සඳහන් පරිදි අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද සපුරා තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එම වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
3. තෝරා ගනු ලබන තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, වැඩ හා හැසිරීම, පැමිණීම සතුටුදායක තත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.
4. දැනටමත් මෙම මහා නගර සභාවේ ස්ථිර අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

06. ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඒ සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් සමග 2019.04.05 වැනි දිනට ප්‍රථම ලැබෙන්න සලස්වන්න.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය,

(iv) වෘත්තීය නිපුණතාවය හා පළපුරුද්ද පිළිබඳ සහතිකය,

(v) මෑතක දී ලබා ගත් චරිත සහතිකයක්.

07. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්රුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අසම්පූර්ණ අයදුම්පත්‍ර හා අංක 06 හි සඳහන් තොරතුරු ඉදිරිපත් කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රදීප් තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
කුරුණෑගල.

2019 මාර්තු මස 05 වැනි දින දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම*
....................................................... (තනතුරු නාමය)

01. මුලකුරු සමඟ නම :——————————
මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————

02. ස්ථිර ලිපිනය:——————

03. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

04. උපන් දිනය ඃ- අවුරුද්ද:—————— මාසය :—————— දිනය :——————

05. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ- අවුරුදු :—————— මාස:—————— දින:——————

06. විවාහක/අවිවාහක බව :——————

07. ජාතිය :——————

08. දුරකථන අංකය :——————————

09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? :——————————
එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද? වග

10. අධ්‍යාපන සුදුසුකම් :——————————
අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ
සමත් වර්ෂය:—————— විභාග අංකය:——————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. (1) වෘත්තීය සුදුසුකම් :——————————
(2) සේවා පළපුරුද්ද :——————————
(3) වෙනත් විශේෂ සුදුසුකම් :——————————
(4) සියලුම අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම්පත සමඟ අමුණා එවිය යුතුය.

12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුතුව සිටී නම්,
දැනට දරන තනතුර:——————————
අනියම්/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග:——————————
එම තනතුරට පත් වූ දිනය:——————————

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ.................................

03 - 983

## අලව්ව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ප්‍රමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) | 02 | රා. ප. ච. ලේ. 3/2016 PL 3-2016 25790-10x270-10x300-10x330-12x350- රු. 38,990 (රා.ප.ච.ලේ. 3/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය. |

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරු අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර (03) නොඅඩු කාලයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. (ඡන්දහිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතුය)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

(දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iv) තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

(v) රජයේ ආයතනයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් වෘත්තිය පුහුණුව පිළිබඳව අනුමත සහතිකයක් ලබා තිබිය යුතුය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඩුවම් ලැබුවෙකු නොවිය යුතුය.

(vii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් , වාචික පරීක්ෂණයක හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. *සේවය නියුක්තයකු වීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීමක් වන අතර, අවම වශයෙන් වසර 02ක සේවා කාලයක් සඳහා ගිවිසුමකට යටත් වේ.

(ii) මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා

කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුය.

06. *අයදුම්පත ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2019.04.16 හෝ එදිනට පෙර ''ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව, අලව්ව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කල යුතුය.

(iii) අයදුම්පත සමග ඉහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපන සහතිකය ;
(ඇ) අස්වීමේ සහතිකය ;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.) ;
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඊ) වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේදි හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල සහ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

2019 මාර්තු මස 15 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

**අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

..............................................................තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග:——————————

02. මුලකුරු වලින් හැඳින්වෙන නම:——————————

03. ස්ථිර ලිපිනය:——————————

04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————

06. දිස්ත්‍රික්කය:——————————

07. උපන්දිනය:

වර්ෂය:—————— මාසය:—————— දිනය:——————

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————— මාස :—————— දින:——————

09. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන් ද යන වග:——————————

11. විවාහක/අවිවාහක යන වග:——————————

12. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

13. අධ්‍යාපන සුදුසුකම්:——————————

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම්:——————————

15. සේවා පළපුරුද්ද:——————————
   (අ) දැනට සේවය කරන ආයතනය:——————————
   (ආ) දැනට දරන තනතුර:——————————
   (ඇ) එම තනතුරට පත්වූ දිනය:——————————
   (ඈ) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන තනතුර :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————;
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

*දැනටමත් රාජ්‍යසේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ..................................................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:——————.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

03-844

---

## කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගනු ලබන ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක | iii | 03 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා.පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එකවර සමත් විය යුතුය. | PL-1-2016 රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410/= | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩු වලට පත් කරනු ලැබේ. |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගනු ලබන ශ්‍රේණිය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීමේ ක්‍රමය ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| 02 | සෞඛ්‍ය කම්කරු | iii | 05 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා.පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතු ය.<br><br>සෞඛ්‍ය කම්කරු, යන තනතුරු සඳහා පමණක් ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවකදී පමණක් 05 ශ්‍රේණිය සමත් වීම දක්වා ඉහත සුදුසුකම් අඩු කර බඳවා ගැනීමට සලකා බැලේ. | PL-1-2016 රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410/= | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩු වලට පත් කරනු ලැබේ. |

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

III. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය.

VI. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

VII. දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ස්වේච්ඡා/ස්ථිර/පදනම මත සේවයේ යෙදෙන සේවකයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

VIII. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී, මධ්‍යම පළාතේ මෙම තනතුරුවලට අදාලව නව බඳවා ගැනීම් පරිපාටි/ව්‍යවස්ථා සංශෝධන වීම් සහ ව්‍යවස්ථා ආදේශ කිරීම්වලට යටත්ව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම, සංශෝධනය කිරීම කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

02. *සේවා නියුක්ති කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය, තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

II. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

III. මෙම බඳවා ගැනීම් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලට ද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට අනුව ද මධ්‍යම පළාත් සභාව හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

03. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය :

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතිකය,
III. ජාතික හැඳුනුම්පත් ඡායා පිටපත,
IV. ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය/ඩීඑස් 04 ආකෘතිය (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව),
V. මෑතකදී ලබා ගත් වෙනත් චරිත සහතික 01ක්,
VI. පළපුරුද්ද පිළිබඳ සහතික,
VII. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික .

04. වෘත්තීය තොරතුරු සමඟ සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් පහත සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල සහතික කළ පිටපත් ද සමගින් 2019.04.18 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

05. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

06. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

07. නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.
මැණික්හින්න.

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ...................................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. මුලකුරු සමඟ නම :——————————————.
   (i) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————————.
2. ස්ථිර ලිපිනය :——————————————.
3. උපන් දිනය - අවුරුද්ද :——————————. මාසය :——————————. දිනය:——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
6. දුරකථන අංකය : | | | | | | | | | | |
7. විවාහක/අවිවාහක බව :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :
   8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පංතිය :- සිංහල :——————————
   දෙමළ :——————————
   8.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය :
   i. වර්ෂය :—————————— මාසය :——————————
   ii. විභාග අංකය :——————————.

iii. ප්‍රතිඵල ඃ

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උ/පෙළ) විභාගය

i. වර්ෂය:—————— මාසය :——————.
ii. විභාග අංකය :——————
iii. ප්‍රතිඵල ඃ

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඃ:——————.
10. වෙනත් සුදුසුකම්:——————
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? :——————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වන බව ද මම දනිමි.

.............................. ........................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ ..................................................... තනතුර දරන .................................................................. මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

....................................... .................................................................................. ;
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

03-937

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) පිරිමි අයදුම්කරුවන් පමණි | 06 | දෛනික වැටුප් | රජයේ අනුමත පාසලකින් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |

*01. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුය.)

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

IV. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. සම්මුඛ පරීක්ෂණට පැමිණෙන විට අයදුම්කරුවන් සියළුම සහතිකවල මුල් පිටපත් රැගෙන ආ යුතුය.
3. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
4. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් වසරක කාලයකට හෝ අදාළ වෘත්තීය වැඩසටහන අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා බඳවා ගැනේ.
6. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.

2. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2019.04.01 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුය.

3. අයදුම්පත සමග පහත සඳහන් සහතිවල පිටපත් අමුණා එවිය යුතුය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතික,
III. තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය,
IV. මැතක දී ලබා ගත් චරිත සහතික 02ක්,
V. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය,
VI. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 08 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. i. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————————

ii. මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————————

02. ස්ථිර ලිපිනය:————————————

03. i. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :——————. දිනය:——————

ii. 2019.04.01 වැනි දිනට වයස : අවුරුදු :—————— මාස :——————. දින :——————

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

06. විවාහක/අවිවාහක බව :

07. ජාතිය :——————

08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————.

09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.

10. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වූ විභාග පිළිබඳ විස්තරය)

i සමත් වූ වසර/ශ්‍රේණිය :—————— වර්ෂය :——————

ii. අ.පො.ස. (සා/පෙළ) විභාගය ඃ

විභාග අංකය :——————. වර්ෂය :——————

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

iii. අ.පො.ස. (උ/පෙළ) විභාගය ඃ

විභාග අංකය :—————— වර්ෂය:——————

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර:——————

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :——————

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහෝ මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

.............................. ........................................
දිනය අයදුම්කරුගේ අත්සන.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහත දන්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට .............................................. වශයෙන් සේවය කරන බවටත් සහතික කරමි.

........................................ ......................................................
දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

03-1150

# පළාත් පාලන නිවේදන

### සම්මත අතුරු ව්‍යවස්ථාව

### නිවිතිගල ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන අංක 1952 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නිවිතිගල ප්‍රාදේශීය සභාව විසින් 2018.11.01 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 5 : 1 : v දරණ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිවිතිගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 01 වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධි විධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන(සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාත්, පලාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද, සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2018.07.20 දිනැති අංක 2,081 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්දා වූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිවිතිගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

03-847

---

### ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් 2019 වර්ෂයේ ජනවාරි මස 22 දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01:05 යටතේ පහත දක්වා ඇති යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී.ඕ.ජී.ඩී.එන්.බී.ජයසේකර,
සභාපති,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුඳුවත්ත කඩවීදිය.

2019 ජනවාරි මස 22 වැනි දින,
කුරුඳුවත්ත කඩවීදිය පිහිටි.
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන, අධිකාරිය වන 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් , පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ පලකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ පලකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ පහත සඳහන් අතුරු ව්‍යවස්ථා, මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පලකරනු ලබන දින සිට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

02. ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

03. මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

04. පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

05. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

06. ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

07. සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

08. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

09. සත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

10. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

11. පෞද්ගලික ඉගැනුම් ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

12. සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

13. ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා වූ සැළසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව

14. කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

03-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.